# නව යුගයක පැතුම

1. පෙරදා හෙළ බිමේ දියුණුව සිහි කරමු
හැරදා අලස බව ගත සිත වෙර දරමු
විහිදා දසත ලොව තුළ කිතුරැස් නගමු
සැමදා නිවහල්ව සිටිනට දිරි දරමු

2. සිතින් පතමු බස රැස දෙස දියුණු ගැන
අතින් ගනිමු දැකැති උදලු හැම දෙන
ගතින් හෙළමු දහඩිය රන් දහර මෙන
බැතින් පතමු නැගුමට දැය සියලු තැන

3. අපගේ වීර මිණි මුත්තන් පෙර කාලේ
ලොවගේ පැතුරුවා අබිමන් හෙළ තාලේ
මුවගේ මතුරමින් දියුණට දැ ආලේ
හැමගේ පැතුම වේවා ! දිව රැ වේලේ

4. අහසින් වැටෙන මිණිවන් දිය රැක ගනිමු
රන්වන් පොළොවෙ පලබර ගහ කොළ වවමු
මෙලෙසින් අහර පැනයට විසඳුම් සොයමු
එමගින් දැයේ දියුණුව යහපත දකිමු

5. නිසිකල ජලය සරු පසකුත් තිබේ නම්
ගතසිත පිණන පරිසරයක් ලැබේ නම්
සරුපල දරණ හැම ගහ කොළ වැවේ නම්
තවෙකෙකුට වහල් වනු ඇයි අපි හෙළේ නම්

6. ගැලූ ගැලූ දිය දහර සරුබිම මුසු වේවා
බැලූ බැලූ සියලු ගහ කොළ පල බර වේවා
හෙලූ හෙලූ සෝ සුසුම් දුකඳුරු දුරු වේවා
අරුණලු සමඟ නව යුගයක් බිහි වේවා

ශාස්ත්‍ර විශාරද
**ඩී. ඇස්. හපුනන්තිරි**